# නීතිය හා සිරිත

මුන්නේස්සරමේ සීලරතන හිමි

සමාජ පාලන කාරකයන් වශයෙන් නීතිය හා සිරිත සමාජ ව්‍යූහයක් තුළ ඉටුකරණ කාර්යභාරයත් ඒ දෙකෙහි ඓතිහාසික සංවර්ධනය හා සම්බන්ධයත් පළිබඳ විමසීමක් කිරීම මෙහිදී අදහස් කෙරේ. සිරිත යනු සමාජ පාලනයෙහි ලා යොදගනු ලබන උපයෝගී කරගනු ලබන අවිධිමත් සංවිධානයක් බවද, නීතිය යනු එම කටයුත්තෙහිදී උපයෝගී වන විධිමත් සංවිධානයක් බවද, ඇතැම් සමාජ මානව විද්‍යාඥයන්ගේ අදහසය. කිසියම් සමාජ පාලන කාරකයක් නීතියක් ලෙස ව්‍යවස්ථාපිත කිරීමට පෙර සිරිතක් වශයෙන් සමාජය තුළ පවතින බවද සමාජය සංකීර්ණවත්ම එමසිරිත ව්‍යවස්ථාපිත නීතියක් බවට පත්වන සැටිද නීතිය හා සිරිත යන දෙකෙහි ඓතිහාසික වර්ධන ක්‍රියාවලියෙන් පැහැදිලි ලෙස පෙනී යන්නකි. බුද්ධශ්‍රාවක භික්ෂු සංඝයා සඳහා වූ ව්‍යවස්ථාපිත විනය නීති සංග්‍රහය ග්‍රන්ථ 05 කින් යුත් සමස්ත විනය පිටක යයි. සරළ වශයෙන් ගත්කළ ශික්ෂා 227 කින් යුත් භික්ෂු ප්‍රාතිමෝක්ෂයයි. භික්ෂූන් වහන්සේ බහුවිධ අපේක්ෂාවන්ගෙන් යුක්තව සංකීර්ණ සංස්ථාවක් බවට වැඩී යනතුරු ප්‍රාථමික සරළ භික්ෂු සමාජය තුළ පාලනය සඳහා ව්‍යවස්ථාපිත නීති පද්ධතියක් නොවූ බව පැහැදිලිය. එම සාමකාමී යුගය "ප්‍රථම බෝධි සමය" නමින් දක්වෙයි. එකල භික්ෂු සමාජය පාලනය වූයේ චාරිත්‍රවිධි සමූහයක් අනුගමනයෙනි. ස්වකීය ශාස්තෘවරයාගේ අනුශාසනය සිහියේ තබාගෙන කටයුතු කිරීම කළයුතු විය. එය චාරිත්‍රවිධි හෙවත් "සිරිත" මගින් පාලනයවූ කාලපරිච්ඡේදයක් ලෙස සැලකිය හැකිය. යුග දෙකක භික්ෂු සමාජයෙහි පාලනය පිළිබඳ මෙම කෙටි නිදර්ශනය මා ඉදිරිපත් කළේ සිරිත හා නීතිය සමාජ පාලන කාරකයන් දෙකෙහි වෙනසත් සම්බන්ධතාවත් කිසියම් ලෙසකින් පැහැදිලි කරලීම සඳහාය. 'සිරිත' සමාජ පාලනයෙහි ලා ශක්තිමත් සාධකයක් නොවූවිට නීතිය ඇතිවන සැටියතුත් සරළ-ප්‍රාථමික සමාජ පාලනයෙහි සිරිත නියුක්තව ඇති ආකාරයකුත් හා සංකීර්ණ සමාජ පාලනයෙහි නීතිය උපයෝගී වන ආකාරයකුත් මෙම නිදසුනින් ගම්‍යවන තවත් අදහසක් විය හැකිය. ඒ කෙසේවතුදු මෙම පදනමෙහි පිහිටා තරමක් පුළුල් ආකාරයකින් මෙම සංකල්පයන් දෙක පිළිබඳ විග්‍රහයක් කිරීම සුදුසු වන්නේය.

දේශපාලනමය වශයෙන් සංවිධානය වූ සමාජයක සංවර භාවය ඇතිකරලීම සඳහා බලය ක්‍රමානුකූල ලෙස් භාවිතා කිරීම නීතිය යැයි Roscoe Pound (රොස්කෝ පවුන්ඩ්) කීය. මේ අනුව සළකා බලනවිට නීතිය එක්තරා සංවිධානයක් වන අතරම එය සමාජ පාලනයෙහි උපයෝගී කරගනු ලබන්නක් බවද පෙනේ. එමෙන්ම එහි එක්තරා ක්‍රමානුකූල බවක්ද ඇතිවිය යුතුය. යම්කිසි සමාජයක ප්‍රාදේශීය වශයෙන් වෙන්වූ සීමාවන් ඇති අතර එම සීමාවන් තුළ ජීවත්වන මිනිසුන් පාලනය කිරීම සඳහා එක්තරා අන්දමක සංවිධානයක් අවශ්‍යය. කිසියම් සමාජයක පමණක් නොව ඕනෑම සංස්ථාවක් තුළද එහි පාලනය සඳහා කිසියම් සංවිධානයක් පැවතිය යුතුබව පැහැදිලිය. එම සංවිධානය යන්නෙන් කිසියම් බලයක් අදහස් කෙරේ. එය කායික හෝ ව්‍යවස්ථානුගත බලයක් විය හැකිය. සමාජගත හෝ සංස්ථාගත පුද්ගලයන්ගේ විවිධාකාරවූ සංකීර්ණගති පැවතුම් හේතුකොට ගෙන ඔවුහු නොයෙක් ප්‍රභේදයන්ගෙන් යුක්තව සිටිති. එක්තරා ආකාරයක සංවිධානාත්මක බවක් ඒ සමාජ හා සංස්ථා තුළ දක්නට ඇත. විවිධ ගැටුම් හා වෙනස්කම්ද දැකිය හැකිය. එමනිසා මානව සමාජය පවත්වාගෙන යාමේදී එහි පවතින මෙම ගැටුම්කාරී ස්වභාවයත් විවිධ ප්‍රභෙදයන් හා අසමගිකම්ද මානව සමාජයේ සංවිධනාත්මක බව රැකගැනීම කෙරෙහි අහිතකර ලෙස බලපායි. ඒ තත්ත්වය නැතිකොට සමාජපාලනයෙහි ඇතිකිරීම සඳහා යොදගනු ලබන උපකරණයන් ලෙස නීතිය හා සිරිත හැඳින්විය හැකිය.

ප්‍රාථමික ගෝත්‍රික සමාජවල ව්‍යවස්ථාගත නීති පද්ධතීන් ක්‍රියාත්මක නොවුනත් ඔවුන්ගේ වර්ගයා පාලනය කිරීමෙහි ලා උපයෝගී කරගනු ලැබූ චාරිත්‍ර සමූහයක් විය. අප 'සිරිත" ලෙස හඳුන්වන්නේ එයයි. මහජන මතය හා මහජන අදහස් විවේචන ප්‍රබල ලෙස බලපාන දෙයක් වශයෙන් සිරිත හැඳින්විය හැකිය. කිසියම් සමාජයක සාමාජිකයන් විසින් පිළිගනු ලබනතාක් කල් සිරිතක් එම සමාජය තුළ ප්‍රබල පාලන උපකරණයක් බවට පත්වේ. තවත් තවත් ආකාරයකින් කිවහොත් සමාජ පාළනයෙහි ඇතිකරනු ලබන අවධිමත් සංවිධානයක් ලෙස සිරිත හැඳින්විය හැකිය. කිසියම් සිරිත් සමූහයක් සමාජ පාලන කාරකයන් වශයෙන් පවතින අතර එම සමාජයේ කිසියම් සාමාජිකයෙකු එම සිරිත කඩකරයි නම් ඔහුට දීමට නීතිගත හෝ සම්මත දඬුවමක් නැත. එහෙත් සමූහයා විසින් දක්වන ප්‍රතිචාරය ඔහුට (වරදකරුට) තදබල මානසික දඬුවමක් වෙයි. සිරිත කඩන්නාට බොහෝවිට කායික දඬුවම් නැත. අන්තිම වශයෙන් සමූහයෙන් පන්නා දැමීම වැනි බරපතල දඬුවම්ද දක්නට ලැබේ. අද දියුණු සමාජ

වලද නීතියට අමතරව සිරිත පවතින අතර නීතිය ඉක්මවා යන්නන් මෙන්ම සිරිත කඩකරන අයද වෙති. ඇතැම් සිරිතක් නිතර නිතර කඩකරන විට එය නීතියක් බවට පත්වේ. එසේ පවත්වන්නේ සිරිත කඩකළ අයට දෙන ලිඛිත දඬුවම් නැති බැවිනි. නීතිය ලිඛිතව පවතින අතර සිරිත ලිඛිත වූවක් නොවේ. ලිඛිත නීතිය ඉක්මවා යන අයට දෙන නියමිතවූ දඬුවමක්ද ඇත. සිරිතට එසේ නොවේ. එබැවින් නිතර නිතර සිරිත් කඩකරණවිට එම සිරිත නීතියක් බවට පත්කොට එය කැඩූවිට දෙන දඬුවමද නියම කෙරේ. මෙසේ බොහෝ සිරිත් දූන් නීති බවට පත්ව ඇති සැටි බෞද්ධ භික්ෂු විනය පිටකාගත ශික්ෂා පද්ධතීන්ගෙන් හා රාජ්‍ය සම්මත නීතිවලින් පෙනේ. එය සමාජ පාලන පහසුව සඳහා කරනු ලබන්නකි.

සිරිත ශිල්පීය වශයෙන් දියුණු නොවූ සමාජ සම්ප්‍රදයක් ලෙස පවත්වාගෙන එනු ලබන පුරුදු පුහුණු කරනු ලබන දෙයක් වන අතර "නීතිය" ශිල්පීය වශයෙන් දියුණුවූ ලේඛනගත ව්‍යවස්ථා ස්වරූපයක් දරයි. සිරිත මුළු සමාජයටම හෝ උපසමූහයන් කරා බෙදහරිනු ලබන්නේ පුරුදු පුහුණු කරන්නේ එම සමාජගත සමූහයන් තුළිනි. එම බෙදහැරීම සඳහා වෙන්වූ සංවිධානයක් හෝ පුද්ගලයෙක් නැත. නූතන සමාජය ආශ්‍රයෙන් බලනකල නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා මෙන්ම සම්පාදනය සඳහාද පත්කර ගන්නාලද මණ්ඩල-සංවිධාන පවතී. E. B. Tylor (ඊ. බී. ටයිලර්) නැමති මානව විද්‍යාඥයා සිරිත හඳුන්වනු ලබන්නේ ජනවහරෙන් හඳුනාගත් සංස්කෘතික සංකල්පයක් ලෙසයි. සුප්‍රසිද්ධ මානව විද්‍යාඥයන් වන C. H. Page (සී. එච්. පේජ්) සහ Mc Iver (මැක් අයිවර්) යන දෙදෙනා සිරිත ජනවහර හා ගණචාරයන් වශයෙන් කොටස්කර දක්වයි. මෙයට නොයෙක් අභිචාර ක්‍රම ඇතුළත්වන අතර නීතිය වැනි සංග්‍රහ කිරීමක් හෝ ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා බලය පැවරුණ බලාධිකාරී මණ්ඩලයක් හෝ අනපනත් දක්නට නැත. නීතිය මෙන් සිරිත සමාජයට බලයෙන් පනවන ලද්දක් නොවේ. සමාජයේ සාමාජිකයන්ගේ අවශ්‍යතාව තුලින් ඉබේම ඇතිවූවකි. සිරිතක් කඩකළ පුද්ගලයෙකුට දඬුවම් දෙනු ලබන්නේ මුළු සමාජය මඟින්ම වන අතර නීතිය කඩකළ අයට දඬුවම් පැමිණවීම සඳහා විශේෂ බලාධිකාරයක් සම්මතව ඇත. මේ හේතුව නිසාම සරල සමාජවල පැවති සිරිත කිසිදු සංවිධානාත්මක බවකින් තොර නීතිමය ලක්ෂණ වලින් වියුක්ත තත්ත්වයක් ලෙස පවතින ලදැයි සනාථ කිරිමට ඇතැම් මානව විද්‍යාඥයන් උත්සාහ දරනු පෙනේ. එහෙත් එය සාධාරණ උත්සාහයක් නොවේ. සරල සමාජවල පැවති සිරිතෙහි නීතිමය මූලික අවස්ථාවන් අපට දැකිය හැකි බැවිනි. වියවුලෙන් තොර සංවිධානාත්මක බවකින් යුතු සමාජයක් ලෙස ප්‍රාථමික සරල සමාජ පවත්වාගෙන ආයේ ඒ නීතිමය ලක්ෂණ නිසාය. පිළිගත් සම්ප්‍රදයයන්ට අවනත වීමක් වත්මන් නීතිගරුක භාවයට වඩා දියුණු තත්ත්වයකින් සිරිත සමාජ පාලන කාරක ලෙස පැවති සමාජ තුළ දැකිය හැකි බව පැහැදිලිය. නීතිය කඩකළ අය කායික වශයෙන් ලබන දැනුමට වඩා සිරිත ඉක්මවා ගියවිට කරනු ලබන සමාජ ආශ්‍රයෙන් වෙන්කිරීම සහභෝජන තහංචිය වැනි මානසික දඬුවම් පුද්ගලයා අනාගත වරදෙහි බැඳීමෙන් මුදවනු ලබන දැඩි ශික්ෂණයක් ලබා දෙන්නක් බව ඇතැම් සමාජ පාලන කාරකයන්ගේ දීර්ඝකාලීන ප්‍රතිඵල පරීක්ෂාවෙන් පෙනී යන්නකි. කෙසේ වුවද වඩා සාධාරණත්වය ඉටුවන්නේ සමාජ පාලන කාරකයක් ලෙස සිරිත පවතින සරල සමාජවල බව පැහැදිලිවේ. සම්මතයක් කඩකළවිට හෝ සමාජ අපගාමී ක්‍රියාවක යෙදුනවිට මුළු මහත් සමාජයම එයට එරෙහිව නැඟී සිටුනා බැවිනි, ඒ අනුව වරදට සාධාරණයට දඬුවම් නොපමුණුවා මග හැරිය නොහැකිය. සිරිතට පිටුපා කටයුතු කළ නොහැකිය. සමාජයම ඊට එරෙහිව නැගී සිටිනා හෙයිනි. එහෙත් නීතිය එසේ නොවේ. එහිලා වරදට දඬුවම් දීමේදී එම නීතිය ක්‍රියාත්මක කරලීම සඳහා පිහිටුවා ඇති මණ්ඩලයට අගතිගාමීලෙස ක්‍රියාකළ හැකිය. පක්ෂපාතී විය හැකිය. බලපෑම් වලටද ලක්විය හැකිය. ඒ අනුව එසේ අසාධාරණ ලෙස බලපෑම්කොට දඬුවමින් මිදීමට බේරීමට සිරිත යටතේ නොහැකිය. සිරිතට පසුතලය වී ඇති මෙම මහජන මතය අනුව බලනවිට සරල සමාජයකදී පුද්ගලයෙකු විසින් නොකළයුතු ක්‍රියාවක් කරනු ලැබූ විට ඔහු හෙළා දැකීම ප්‍රබල වශයෙන් කරනු ලබන්නකි. නුවර් සමාජයේ පුද්ගලයන් අතර ගැටුම් ඇතිවූ විට සහභෝජන තහන්වියද එවැනි එක් දඬුවම් ක්‍රමයකි. "සිරිත" ඉක්මවීමේ වරදට දඬුවම මුළු සමාජයම ඒකමතිකව තීරණය කළයුතු බව මේ අනුවද පැහැදිලි වේ. පොදු ජනමතයට ඇති බිය නිසාත් වරදින් වැළකීමේ කිසියම් ප්‍රවණතාවක් සරල සමාජයේ වූවන් තුළ මේ අනුව දැකිය හැකි වන්නකි. නීති ක්‍රමයක පවතින කිසියම් සංවිධානාත්මක සම්බන්ධයක් සිරිත සම්බන්ධයෙන්ද ක්‍රියාත්මක වන බව මෙහිදී පැහැදිලි ලෙසම දත හැකිය. වර්තමාන නීතිගරුක සමාජයේ විනිශ්චය කරුවන්හට හිමි තැන ප්‍රාථමික සරල සමාජවල වැඩිමහල්ලන් හට පවරා තිබූ බව ඇතැම් මානව විද්‍යාඥයන්ගේ අධ්‍යයන වලින් හෙළිවී ඇත.

නීතිය හා සිරිත එකම මූලයක අවස්ථා දෙකක් බව මැලිනොවුස්කි නමැති මානව විද්‍යාඥයාගේ අදහසයි, ඔහුට අනුව සෑම ආකාරයකම සමාජ පාලන නීති කෙනෙකුගේ යුතුකමක් වන අතර තවත් කෙනෙකුගේ වගකීමක් බවට පත්වේ. මැක්ස් වේබර් ගේ මතය අනුව මිනිසුන්ගේ හැසිරීම පාලනය කරන නීති රීති සමහරවිට සම්ප්‍රදායානුකූලද සමහර විට නීත්‍යනුකූලද විය යුතුය. සාමාන්‍ය සිරිත් විරිත් මෙන්ම නීතියක් උල්ලංඝනය කිරීමෙන් වන්නේ සමාජ විරෝධතාවක් ඇතිවීමකි. ඕනෑම සමාජයක් නීතියෙන් පමණක් හෝ සිරිතකින් පමණක් පාලනය නොවන බව වේබර්ගේ මතයයි. නීතිය ඇත්තේ දේශපාලන වශයෙන් සංවිධානය වූ සමාජයක පමණකැයි සමහරු කියති. මේ බලය පාවිච්චි කරනුයේ සමාජය පිළිගත් පිරිසක් විසිනි. මෙවැනි සංවිධාන නැත්නම් සමාජයේ නීතියක් ඇතැයි පිළිගත

නොහැක. නීතිය හා සිරිත යන දෙකින්ම කරන්නේ මිනිසුන්ගේ හැසිරීම පාලනය කිරීමයි. සිරිතෙන් සමාජයක් පවත්වාගෙන යා හැක්කේ එය ඒ සමාජයේ සාමාජිකයන් ක්‍රියාවට නගනවා නම් පමණි. සිරිතට සමාජ පාලනය බැරිවූ විට නීතිය හටගැනෙන බවද කලින් සඳහන් කෙරිණි. සිරිතට අනුව සමාජ සංවර්ධනය කරන්නට නොහැකි අවස්ථාවල නීතිය ඉවහල් කරගනු ලබන අතර එය ස්ථාවර භාවයට පත්වී සිරිත යටපත්වී යයි. සම්ප්‍රදායික සරල තත්ත්වයේ සමාජයක වුණත් ක්‍රමයෙන් සමාජ වෙනස්වීම් ක්‍රියාවලියට හසුවීමේදී සිරිතෙන් වන සමාජ පාලනය ප්‍රමාණවත් නොවේ යැයි හැඟියනවිට නීතිය වැනි සංවිධානාත්මක ආයතනවල බිහිවීම ඇතිවන බව ඒ අනුව පැහැදිලි වන්නකි. මෙසේ සමාජ පාලන කාරකයන් වශයෙන් නීතිය හා සිරිත යන සංකල්ප දෙකම සාමාජික කාර්යය භාරයන් උසුලන අතර ඒ දෙකෙහි කිසියම් සබඳතාවක් ද දැකිය හැකිබව පෙනේ.